www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ ආන්ඩුව බරපතල ආන්ඩුක්‍රම ව්‍යවස්ථා වෙනස්කම් ගෙන ඒමට සැරසේ

## Sri Lankan government prepares major constitutional changes

**නන්ද වික්‍රමසිංහ විසිනි**

**2010 ජූනි 24**

ආන්ඩුව පාර්ලිමේන්තු මැතිවරනයෙන් තුන්මසක් ගතවීමට පෙර ගෙන ඒමට සැරසෙන ව්‍යවස්ථා සංශෝධන මාලාවේ ඉලක්කය වන්නේ ජනාධිපති මහින්ද රාජපක්ෂ දිගින් දිගට ම බලයේ තබාගැනීම ද ඔහුගේ අත්තනෝමතික පාලන ක්‍රමය ශක්තිමත් කිරීම ද වේ.

අගමැති ඩී.එම්. ජයරත්න ජූනි 9 වෙනිදා යෝජිත සංශෝධන කැබිනට් මන්ඩලයට ඉදිරිපත් කරමින් ඉදිරි සතිවල දී "හදිසි පනතක්" ලෙස ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට යන බව දැනුම් දුන්නේ ය. මේවා පිලිබඳව මහජනයා අතර සාකච්ඡාවක් ඇතිවීම වැලැක්වීමට ආන්ඩුවට උවමනා වී තිබේ. එවන් සාකච්ඡාවක් ඒවායේ ප්‍රජාතන්ත්‍ර විරෝධී භාවය එලිදරව් කරතැයි ආන්ඩුව බියවෙයි.

යෝජිත සංශෝධනයන් අතර දෙකක් ප්‍රධානය. ඉන් පලමුවැන්න නම් ජනාධිපති වරයෙකුට පත්විය හැකි නිල වාර සංඛ්‍යාව දෙකකට සීමා කෙරෙන වගන්තිය ඉවත් කොට තමන්ට ඕනෑ වාර ගනනක් ඉදිරිපත් වීමට ජනාධිපති රාජපක්ෂට ඉඩ සලසා දීම ය. රාජපක්ෂ ප්‍රථමයෙන් බලයට පැමිනියේ 2005 ඡන්ද විමසීමෙනි. ගිය ජනවාරියේ දී යලිත් පත්වූ ඔහු ගේ කාලය 2016 නොවැම්බර් මස අවසන් වීමට නියමිතය.

යෝජිත තවත් එක් සංශෝධනයක් නම් පවත්නා ව්‍යවස්ථාවේ 17 වෙනි සංශෝධනය මගින් නියම කෙරෙන ව්‍යවස්ථා මන්ඩලයක් පත් කිරීම අහෝසි කිරීම ය. 2001 වසරේ දී 17 වන ව්‍යවස්ථා සංශෝධනය පනවන ලද්දේ කලින් හිටපු ජනාධිපතිවරුන් රාජ්‍ය තන්ත්‍රය දේශපාලනකරනය කිරීම ගැන පැවති තියුනු ප්‍රසිද්ධ සාකච්ඡාවකින් පසුව ය. 17 වෙනි ව්‍යවස්ථා සංශෝධනයෙන් නියමිත ව්‍යවස්ථා මන්ඩලයට පොලීසිය, ඡන්ද විමසීම් සහ ආන්ඩුවේ සේවය ඇතුලු ප්‍රධාන පෙලේ ආන්ඩුවේ සංස්ථාවන් ද ආන්ඩුවේ පත් කිරීම් ද අධීක්ෂනය කිරීමට පලල් බලතල තිබේ. ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාව අගමැති, ඇමතිවරුන් හා ආන්ඩු පත් කිරීමට ද ඉවත් කිරීමට ද පුලුල් බලතල විධායක ජනාධිපතිට පවරයි. ඊට අමතරව දිගින් දිගටම පවත්වා ගෙන යනු ලබන හදිසි නීතිය යටතේ නඩු විභාගයකින් තොරව අත් අඩංගුවට ගැනීමේ ද ස්ට්‍රයික් තහනම් කිරීමේ ද මාධ්‍යවාරනයේ ද බලතල වත්මන් ජනාධිපති සියතට ගෙන සිටී.

බෙදුම්වාදී එල්ටීටීඊ සංවිධානය සමග ලංකාවේ ආන්ඩුව 2002 දී අත්සන් කර තිබුනු ජාත්‍යන්තරව පිලිගැනුනු සටන් විරාම ගිවිසුම ඉරාදැමූ රාජපක්ෂ 2006 මැද දී රට යලිත් වරක් යුද්ධයට ඇද දමා යුද්ධය කරගෙන යාම සඳහා පොලිස් රාජ්‍ය බලතල යොදා ගත්තේ ය. තමා පය තබා සිටි අස්ථාවර පාර්ලිමේන්තු සභාගය වෙනුවට දැන් ඔහු එන්න එන්නම වැඩි වැඩියෙන් පදනම් වන්නේ ඥාතීන්ගෙන් ද ඉහල නිලධාරීන් සහ හමුදා ජෙනරාල්වරුන්ගෙන් ද සමන්විත දේශපාලන මිලිටරි කූට්ටුවක් මතය.

17 වෙනි සංශෝධනය සරලවම අතහැර දැමූ රාජපක්ෂ ප්‍රධාන තනතුරුවලට තමාගේ විශ්වාසවන්ත පන්දම්කාරයන් පත් කිරීමට බාධාවක් වියහැකිව තිබුනු ව්‍යවස්ථා මන්ඩලය පත්කිරීම අතපසු කර නවතා දැමුවේ ය. අන්තිමේදී ශ්‍රේෂ්ඨාධිකරනය ව්‍යවස්ථා මන්ඩලය පත් කරන ලෙස ජනාධිපතිවරයාට නියම කල කල්හි ඔහු එය ගනනට ගත්තේවත් නැත. දැන් ඔහු උත්සාහ කරන්නේ 17 වෙනි සංශෝධනය අකර්මන්‍ය කර දැමීමට ය. පවත්නා නීතිය අනුව ජනාධිපති වරයා ව්‍යවස්ථා මන්ඩලයක් පිහිටුවීම සඳහා විපක්ෂය සමග සාකච්ඡා කල යුතු ය. එම මන්ඩලයට ජනාධිපති, අගමැති, පාර්ලිමේන්තුවේ කථානායක, විපක්ෂ නායක සහ අනෙකුත් දේශපාලන පක්ෂ විසින් නම් කරන ලද අයෙක් ඇතුලත් කර ගත යුතු ය. යෝජිත වෙනස්කම අනුව ව්‍යවස්ථා මන්ඩලය අහෝසි වී යනු ඇත. ඒ වෙනුවට ජනධිපති වරයාට නියම වනු ඇත්තේ අගමැති කථානායක සහ විපක්ෂ නායකයාගෙන් "විමසා බැලීම" පමනි.

රාජපක්ෂ, 2009 මැයි මාසයේ දී එල්ටීටීඊය පරාජය කර මිලිටරිය ලත් ජයග්‍රහනය යුද-විජයග්‍රහනවාදී මානසිකත්වයක් අවුලුවා 2010 ජනාධිපතිවරනය සහ පාර්ලිමේන්තු මැතිවරනය

දිනාගැනීමට යොදාගති. ප්‍රධාන විපක්ෂ - එනම් එක්සත් ජාතික පක්ෂය (එජාප) සහ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) - යුද්ධයට සහාය දක්වමින් විකල්පයක් ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කර තිබුනි. එම තතු තුල විපක්ෂ ජනාධිපති අපේක්ෂකයා වූ, කලින් හමුදාවේ ප්‍රධාන ජෙනරාල්වරයාව සිටි සරත් ෆොන්සේකා පහසුවෙන්ම පරාජය කිරීමට රාජපක්ෂ සමත් විය. ඒ වහාම "කුමන්ත්‍රනයක් සැලසුම් කලේය" යන බොරු චෝදනා ගොතා ෆොන්සේකා අත්අඩංගුවට ගන්නා ලදී.

අප්‍රේල් පාර්ලිමේන්තු මැතිවරනයේ දී පාලක සන්ධානය ආසන 141ක් දිනාගත් නමුත් ව්‍යවස්ථා සංශෝධන සඳහා අවශ්‍ය තුනෙන් දෙකේ බහුතරයට තවත් ආසන නවයක් අවශ්‍යවිය. නොයෙකුත් පෙලඹවීම් මගින් විපක්ෂ මන්ත්‍රීන්ගේ සහාය දිනා අඩුව පුරවාගෙන, සැලසුම් කරන ලද වෙනස්කම් සම්මත කලහැකි යයි රාජපක්ෂට හොඳටම විශ්වාස ය. දැනට පවත්නා කුඩා පක්ෂවලට වාසිදායක අනුපාත ඡන්ද ක්‍රමය වෙනස් කිරීම ද ඇතුලු තවත් ව්‍යවස්ථාමය වෙනස්කම් ගනනාවක් කරන බව ආන්ඩුවේ ප්‍රකාශකයින් අඟවා ඇත. කෙසේ වෙතත් මුල්තැන දී ඇත්තේ රාජපක්ෂගේ අත්තනෝමතික පාලන ක්‍රමය තවතවත් ශක්තිමත් කරන සංශෝධනයට ය.

ඉමහත් යුද වියදම් ද ලෝක ආර්ථිකයේ දිගින් දිගටම පවතින්නා වූ ආර්ථික කලබැගෑනිය ද නය කන්දරාවක් නිර්මානය කොට ඇති අතර ආන්ඩුව බලගතු ආර්ථික අර්බුදයකට හසුකර තිබේ. පසුගිය අවුරුද්දේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ගත් නයෙහි කොන්දේසි අයවැය හිඟය බරපතල ලෙස කප්පාදු කිරීමට රාජපක්ෂට බල කරයි. මෙම නය පියවීමට මහජනතාව මත දැවැන්ත බර පැටවිය යුතුය. ඒ සඳහා මෙම දරුනු බලතල අවශ්‍ය යයි ආන්ඩුව ඒත්තුගෙන සිටියි. එල්ටීටීඊය පරාජය කිරීමෙන් පසුව ද ඒකාධිපති පාලන විධික්‍රම තවතවත් තර කරනු ලබන්නේ එම අරමුන සඳහා ය.

සිවිල් වැසියන් දසදහස් ගනනක් මරනයට පත්කලාවූ යුද්ධයේ අවසාන මාසවල දී මිලිටරිය යොදාගත් මුර්ග වැඩපිලිවෙල දිවයිනේ දෙමල සුලු ජනතාව තුල බරපතල ප්‍රතිරෝධයක් අවුලුවා තිබේ. ජීවන තත්වයන් සහ ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහිව එන්න එන්නම උග්‍ර කෙරෙන ආන්ඩුවේ ප්‍රහාර වඩාත් පුලුල් මහජනතාව තුල පැසෙන වෛරයක් ජනිත කොට ඇත. පසුගිය අවුරුද්දේ දී පෙට්‍රෝලියම්, වරාය, ජල සම්පාදනය සහ බලශක්ති අංශවල කම්කරුවන් තම වැටුප් වැඩිකරගැනීම සඳහා ඇරඹූ කාර්මික අරගල නීති විරෝධී කිරීමට රාජපක්ෂ හදිසි බලතල යොදාගත්තේ ය. සමාජ කලබැගෑනිය තවතවත් උග්‍රවන බව ආන්ඩුව මැනවින් දනී. වැඩ බලන මාධ්‍ය ඇමති ලක්ෂ්මන් යාපා අබේවර්ධන කැබිනට් මන්ඩලය ව්‍යවස්ථාව වෙනස් කිරීමේ යෝජනා සම්මත කරන ලද බව ජූනි 10 දා නිල වශයෙන් දැනුම් දෙමින් මෙසේ කියා සිටියේ යː "රට දැන් ගමන් කරමින් සිටින්නේ ශ්‍රී ලංකාවේ ස්ථාවරත්වයක් ඇති කිරීම සඳහා අවශ්‍ය වෙනස්කම් 'පරිපාලනමය සහ ව්‍යවස්ථාදායක ව්‍යුහය' තුල ඇතිකිරීමට අප ක්‍රියා කරමින් සිටින්නාවූ කාල පරිච්ඡේදයක් තුලින් ය."

රාජපක්ෂ ආන්ඩුව එල්ටීටීඊයට එරෙහි යුද්ධයට යොදාගත් පොලිස් රාජ්‍ය පියවර දැන් තවතවත් ශක්තිමත් කරගන්නේ අන්කිසිවකට නොව, වැඩ කරන ජනතාවගේ කරපිට පටවන අලුත් ආර්ථික බරබද්දල්වලට එරෙහිව අනිවාර්යයෙන්ම පැනනගින්නට යන මහජන අරගලවලට පහර දීම සඳහා ය. "ජාතිය ගොඩනැගීම සඳහා ආර්ථික යුද්ධය" කිරීමට සපථ කරමින් රාජපක්ෂ තම පිලිවෙත් යුද්ධමය වචනවලින් ඉදිරිපත් කරන්නේ අහම්බෙන් නොවේ.

විපක්ෂ දේශපාලන සංවිධාන, ප්‍රජාතන්ත්‍රවාදයේ ආරක්ෂකයන් ලෙස ද ව්‍යවස්ථා සංශෝධනයන්ගේ විරුද්ධවාදීන් ලෙස ද පෙනීසිටිමින් ව්‍යවස්ථා සංශෝධන පියවරයන්ට විරුද්ධවයයි ව්‍යාජ රඟපෑමක යෙදී සිටිති. තම පක්ෂය "දතින් සහ නියෙන්" සටන් වදින බව ප්‍රකාශ කල ජනතා විමුක්ති පෙරමුනේ පාර්ලිමේන්තු නායක අනුර කුමාර දිසානායක මෙම කාරනය පිලිබඳව ප්‍රසිද්ධ විවාදයක් රටපුරා දල්වාලීමට ක්‍රියාත්මක වන බවක් කියා පායි.

ජේවීපීය ප්‍රජාතන්ත්‍රවාදයට දක්වන පිලිකුලට දීර්ඝ වාර්තාවක් ඇත. ඉන්දු-ලංකා සම්මුතියට ද ඊනියා ඉන්දියානු සාමසාධක හමුදා ලංකාවට පැමිනීමට ද විරුද්ධව 1980 ගනන්වල අග භාගයේ දී ජාත්‍යොත්තමවාදී ව්‍යායාමයක යෙදුනු මෙම පක්ෂයේ මැර කන්ඩායම් වෘත්තීය සාංගමිකයන් ද කම්කරුවන් ද දේශපාලන විරුද්ධවාදීන් ද සියගනනක් මරාදැමූහ. 2005 දී රාජපක්ෂට ජනාධිපති ධුරය දිනා ගැනීමට උදව් දුන් ජනතා විමුක්ති පෙරමුන, යුද්ධය යලි ඇරඹීම සඳහා ජනාධිපති ධුරයේ විධායක බලය යොදාගැනීමට පිටු බලය ඔහුට සැපයීය. දැන් රාජපක්ෂ සමග දබර වී සිටින ජවිපෙ මහජන විරෝධය තමන්ට ගාල් කර ගැනීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදී වෙස් මුහුනක් දමාගැනීමට කැසකවයි.

එක්සත් ජාතික පක්ෂයේ මාධ්‍ය කථක ගයන්ත කරුනාතිලක මෙසේ ප්‍රකාශ කලේයː "අපි ආන්ඩුවේ හිතුවක්කාර ක්‍රියාවලට විරුද්ධව සටන් වදින්නෙමු. මෙම ඒකාධිපති යෝජනා වැලැක්වීම සඳහා උසාවි යන්නට වුවත් අප සූදානම් ය." ජවිපෙ මෙන්ම එජාපයේ ද විරුද්ධත්වය පුස්සකි.

1978 දී විධායක ජනාධිපති ධුරය ආරම්භ කලේත් 1980 දී වැටුප් ඉල්ලා වැඩ වර්ජනය කල රාජ්‍ය සේවකයන් ලක්ෂයක් සේවයෙන් පහකිරීමට එම

බලතල යොදාගත්තේත් එක්සත් ජාතික පක්ෂයයි. ඉන් පසු කාලයේ, 1980 ගනන්වල සිට 90 ගනන් මුල දක්වා බලයේ සිටි එක්සත් ජාතික පක්ෂ ආන්ඩු ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ක්‍රමානුකූලව උල්ලංඝනය කිරීම ගැන නම්දරා සිටියෝය.

තම ජීවන තත්වයන් සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ආරක්ෂා කරගැනීමට කම්කරුවන්ට ඇත්තේ එකම මාවතකි. ඒ සඳහා මෙම ධනේශ්වර පක්ෂ සියල්ලන්ගෙන්ම මුලුමනින් ම බිඳී වෙන්විය යුතුය. අවශ්‍යව පවතින්නේ සමාජවාදී සහ ජාත්‍යන්තරවාදී ක්‍රියාමාර්ගයක් මත පදනම්ව මෙම ප්‍රහාරයන්ගේ මූලාශ්‍රය වන සමස්ත ධනපති පද්ධතිය ම පෙරලා දැමීම සඳහා කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීම ය.

© www.wsws.org